විද්‍යාලය : ර/ ඇඹිලිපොල ශ්‍රී මහින්ද මහා විද්‍යාලය
සිංහල භාෂාව හා සාහිත්‍යය : 12 ශ්‍රේණිය පැවරුම්
විෂය භාර ගුරු : ඊ.ජී.එස්.එච්. ඇතුල්දූර
**නිර්දේශිත ග්‍රන්ථය : සද්ධර්මාලංකාරය**

**ප්‍රශ්නය :**
''සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යයෙහි දක්නට ලැබෙන ප්‍රධාන පරමාර්ථයක් වන්නේ සදාචාර ගුණ සම්පන්න සමාජයක් බිහි කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම ය.'' සද්ධර්මාලංකාරයේ නියමිත කතා වස්තු ඇසුරුකොට මෙම කියමන පිරික්සන්න.

## පිළිතුර සඳහා මග පෙන්වීම :

- වැඩිහිටියන්ට ගරු කිරීම, කුසල් හා අකුසල් ලුහුකොට නොතැකීම, යහපත් පවුල් දිවියක් ගත කිරීම, කුල භේදයේ නිරර්ථක බව, ඉවසීම, දුදනන්ට මෛත්‍රී කිරීම, දුරාචායේ හැසිරීමෙහි ආදීනව යන ගුණාංග ඉස්මතු කරමින් සදාචාර සම්පන්න සමාජයක් බිහිකිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම, සද්ධර්මාලංකාර කතුවරයාගේ ප්‍රධාන පරමාර්ථය වූ ආකාරය නිර්දිෂ්ට කතා ඇසුරෙන් නිදසුන් සහිත ව පැහැදිලි කොට තිබිය යුතු ය.

**ස්වර්ණතිලකා කතා වස්තුව**

- ⋆ දියණිය විසින් සිදු කරන ලද අකටයුතු ක්‍රියාව දැක, (129) එය හෙළා දක දුවට බැන අවවාද දීම කෙරෙහි උරණ වූ දියණිය පෙරළා චණ්ඩාල වාදයෙන් මවට පරිභව කිරීම.
- ⋆ ඒ හේතුවෙන් කුලීනයන් විසින් පිළිකෙව් කරන්නා වූ (129) කුලයක ඉපදීම.
- ⋆ උත්තර මධුරා නුවර සිට ස්වර්ණතිලකා හා පියා පංච මධුරා නුවරට යන අතරතුර, රජවරු පස්දෙනෙක් සියදිවි හානි කර ගැනීම.
- ⋆ උද්දාල බමුණු ස්වර්ණතිලකාට ප්‍රේම කිරීමත්, ඇයම ප්‍රාර්ථනා කිරීමත් තුළින් කුලභේදයේ නිරර්ථක බව (135) මනාව පසක් කරලයි.
- ⋆ (135 අග) ප්‍රේමය, කාම රාගය හා ශෝකය ම උපදවන බව මනාව පසක් කරලයි.

**නන්දිවාණිජ කතා වස්තුව**

- නන්දිවාණිජගේ බිරිඳ පතිභක්තිය ආරක්ෂා කරමින් (143) වසර ගණනාවක් තම ස්වාමියා පැමිණෙන තුරු තනිකඩ ව වාසය කිරීම.
- මනා වූ ඉවසීමෙන් යුක්ත ව ශිව අමාත්‍යවරයාගේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීම හා භවයක ඇති නිස්සාරත්වය ධර්මානුකූල ව අවබෝධ කර දීම.
- නන්දිය වෙළෙඳාණන්ගේ ද ධර්මානුකූල දිවි පෙවෙත හා (148) මෛත්‍රී සහගත සිතුවිලි නිසා තමනුත් තමන් සමග සිටි පිරිසේත් ජීවිත ආරක්ෂා විය.
- ශිව අමාත්‍යවරයාත් දුරාචාරයට අනුබල දුන් යකැදුරාත් (149) අකාලයේ ජීවිත විනාශයට පැමිණෙයි.
- ⋆ ''යම් කිසි කෙනෙක් කිසි අපරාධයක් නැති ගුණවත් කෙනෙකුන් මරන්නට උත්සාහ කෙරෙත් නම් එසේ වූ අසත්පුරුෂයා නන්දිය නම් වෙළෙඳාණන් මරන්ට උපක්‍රම කොට මරාගත නොහී විනාශයට පැමිණ සිව නම් අමාත්‍යයා මෙන් තෙමේ ම නස්නේ ය.''
- ⋆ "ඉක්බිති වෙළෙඳාණෝ නැවින් බැස ඇවිත් තමන්ගේ භාර්යාවන් අතින් මෙහි පළමු කී කළ සියලු ප්‍රවෘත්තිය ම අසා අමාත්‍යයා කෙරෙහි කරුණා උපදවා පින්පෙත් දී ජීවිතාන්තය දක්වා සිල් රකිමින් තමන්ගේ පරිවාර ජනයන් හා සමඟ දිව්‍ය ලෝකයෙහි උපන්හ. "